# මොසැක් කලාව ශ්‍රී ලාංකීය නිර්මාණකරණයට එකතුවීම සහ එහි නිර්මාණාත්මක පරිවර්තන

එස්. කුරුණායක[35]

---

මොසැක් කලාව යුරෝපියාණු ආභාසයත් සමග වර්ධනය වූ කලාවක් ලෙස පෙන්වාදීමට පුළුවන.ක්‍රිස්තු වර්ෂ 313 දී කොන්ස්ටන්ටයින් විසින් ක්‍රිස්තියාණුවන්ට නිදහස ලෙස පුද පූජා පැවැත්වීමට අවසර ලබාදී ක්‍රිස්තියාණු ආගමෙහි නිත්‍යාණුකූල බව සහතික කළ පසු පල්ලිය ගොඩනැගීම ආරම්භ විය. ඒ අනුව ඊට සමගාමීව මොසැක් කලාව ආරම්භවීම සිදුවිය. ක්‍රිස්තු වර්ෂ 4-5 සියවස් වලදී කිතුණු යුගයේ මුල් අවධියේදී ඉදිවුණු පල්ලිවල අලංකාර සැරසිල්ලක් ලෙස පිගන් ගඩොල් කැබලි, වීදුරු කැබලි,තහඩු කැබලි,ලෝහ කැබලි මුසු කොට විවිධ සංකේත සහ කිතුණු ආගමික කතාන්දරයන් නිර්මාණය කිරීම ආරම්භ විය.මෙහි ප්‍රතිඵලයක් ලෙස ඉතාලියේ සාන් විතාලේ දේවස්ථානයේ ජස්ටිනියන් අධිරාජ්‍යයා සහ තියඩෝරා රැජින නිරූපිත මොසැක් නිර්මාණය තාත්වික ආකාරයට නිර්මාණය විය.මෙහි නිරූපාත තියඩෝරා රැජින සහ ඇගේ රාජ සභාවේ කාන්තාවන් දක්වෙන සිතුවම තුලින් ත්‍රිමාණ ලක්‍ෂණ සහ තාත්වික භාවය මතුකිරීමට උත්සහ කර ඇතිබව මනාව පසක් වේ.යුරෝපීය බයිසන්තියාණු කලාවත් සමග යටත් විජිත සමයේ ලංකාවට පැමිණි මොසැක් කලාව ලංකාවේ ක්‍රිස්තියානි පල්ලි මූලික කොට ගනිමින් මෙරට ඉදිවූ විවිධ ගෘහ අංගයන්ට එක්වීම සිදුවිය.මඩුවන්වෙළ වලව්ව,කරගම්පිටිය විහාරය,රිදී විහාරය ආදී ස්ථානවල දක්නට ලැබෙන මොසැක් නිර්මාණ එකිනෙකට වෙනස් වූ අභිමතාර්ථයන් යටතේ නිර්මාණය වූ ඒවාබව පෙන්වාදීමට පුළුවන.මෙම පර්යේෂණ තුළින් ඉස්මතු කිරීමට උත්සහ කරනු ලබන්නේ යුරෝපීය ආභාසය ලද කලාවක් ලෙස මෙරටට ලැබුණු මොසැක් කලාව ලංකාවේ මොසැක් නිර්මාණ සිදුකිරීමේදී යුරෝපීය මොසැක් නිර්මාණ මෙන් ත්‍රිමාණ ලක්‍ෂණ පෙන්වීම සිදුකර නොමැති බවත් ද්විමාණ ලක්‍ෂණ පෙන්නුම් කරන අතර තාත්වික ලක්‍ෂණ ඉස්මතු නොවෙයි. යුරෝපීය නිර්මාණ සිදුකිරීමේදී ටෙසරි ක්‍රමය යොදාගෙන තිබෙන අතර ලංකාවේ දක්නට ලැබෙන මොසැක් නිර්මාණවල මෙම ටෙසරි ක්‍රමය දක්නට නොලැබෙයි.ටෙසරි ක්‍රමය යටතේ නිර්මාණය වූ යුරෝපීය නිර්මාණවල දීප්තිමත් බවක් දක්නට ලැබෙන අතර එම ලක්‍ෂණ මෙරට කලාකරුවා ඉස්මතු කර පෙන්වීමට අපොහොසත් වී ඇත.මොසැක් කලාව යුරෝපීය ආභාසයත් සමග ලැබුණු කලාවක් උවත් පසුකාලීනව අපට ආවේණික වූ කලා මාධ්‍යයක් බවට පත්විය.වර්තමානය වන විට මෙහි විවිධ පරිවර්ථන දකගත හැකිය.එහිදී කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහල ඉදාරිපස බිත්තියෙහි මොසෙක් නිර්මාණ ශෛලියෙන් නිම කළ ටෙරාකොටා මාධ්‍ය උපයෝගීකර නිර්මාණය කරන ලඳ නාට්‍යයේ විකාශය දක්වෙන සිතුවම මොසැක් කලාවේ හමුවූ පරිවර්තනයක් ලෙස පෙන්වාදීමට පුළුවන.මෙම පර්යේෂණයේ ක්‍රමවේදය ලෙස යුරෝපීය මොසැක් නිර්මාණ පිළිබඳ අධ්‍යයනය සඳහා අන්තර් ජාලය භාවිතයත් මෙම කලාවේ ඓතිහාසික පසුබිම සහ මොසැක් නිර්මාණ දකියහැකි ස්ථානවල විශේෂතා පිළිබඳ අධ්‍යයනය සඳහා පුස්තකාල ක්‍රමවේදයත් ක්‍ෂේත්‍ර අධ්‍යනයත් සිදුකරන ලදී.මෙහිදී ලංකාවේ මුල් කාලීන මොසැක් නිර්මාණ අධ්‍යයනය සඳහා මඩුවන්වෙළ වලව්ව, කරගම්පිටිය විහාරය හා රිදී විහාරයත් පසු කාලීනව මෙම කලාවේ පරිවර්තන හඳුනාගැනීම සඳහා කොළඹ රාජකීය විද්‍යාලයේ නව රංග පීඨයේ මොසැක් නිර්මාණයත් ගාල්ල මහින්ද විද්‍යාලයේ නිර්මාණය කර තිබෙන මොසැක් නිර්මාණයත් යොදාගනු ලබයි.

ප්‍රමුඛ පද- මොසැක් කලාව, බයිසන්තියාණු කලාව, මෙසරි ක්‍රමය

---

[35]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණඅධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,Shali.kurunayaka@gmail.com.